# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO: 1755 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 26/11/2024 පැය 1640

## මාධ්‍ය නිවේදනය

**01. පස් කන්දක් කඩා වැටීමෙන් කාන්තාවක් මියයාම - බණ්ඩාරවෙල පොලිස් වසම.**

2024.11.26 වන දින උදෑසන කාලයේ බණ්ඩාරවෙල පොලිස් වසමේ බිඳුණු වැව ප්‍රදේශයේදී නිවසක් මතට තාප්පයක් කඩා වැටීමෙන් එම නිවසේ පදිංචිව සිටි කාන්තාවක් මියගොස් ඇති අතර පිරිමි පුද්ගලයකු තුවාල ලබා ඇති බවට බණ්ඩාරවෙල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 61 ක් වූ බිඳුණුවැව, බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

තුවාල ලද එම නිවසේ පදිංචි පිරිමි පුද්ගලයා ප්‍රතිකාර සඳහා බණ්ඩාරවෙල රෝහලට ඇතුලත් කර ඇත.

මෘත ශරීරය බණ්ඩාරවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බණ්ඩාරවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - කුච්චවේලි පොලිස් වසම.**

2024.11.26 වන දින උදෑසන කාලයේ කුච්චවේලි පොලිස් වසමේ කල්ලරාව මුහුදු තීරය ආසන්න ප්‍රදේශයේ නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට කුච්චවේලි පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මෙම මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර වයස අවුරුදු 40 ත් 45 ත් අතර, උස අඩි 05 අඟල් 02 කි. කළු පැහැති කොට කලිසමක් හා සුදු, නිල් හා දුඹුරු පැහැති ඉරි සහිත ලා කොළ පැහැ ටීෂර්ටයක් හැඳ සිට ඇත. හිසකෙස් නොමැති අතර මරණකරුගේ දකුණු අතෙහි මලර් යනුවෙන් සඳහන් කරන ලද පච්චයක්ද ඇත.**

මෘත ශරීරය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණය සිදුකර ඇති අතර, කුච්චවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**